ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2259/11 - 2021 දෙසැම්බර් මස 21 වැනි අඟහරුවාදා - 2021.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2005

**2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත**

2 වන, 3 වන සහ 8 වන වගන්ති යටතේ වූ නියමය

2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 2 වන, 3 වන සහ 8 වන වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ අමාත්‍ය මොහොමඩ් අලි සබ්රි වන මා විසින් මේ නියමය මගින් -

(1) සමථයට පත් කිරීම් මගින් නිරවුල් කළ යුතු ඉහත කී පනතේ විධිවිධාන අදාළ වන්නා වූ ආරවුල් වර්ග තනි පුද්ගලයන් හෝ ආයතන අතර සහ තනි පුද්ගලයන් අතර හෝ ආයතන අතර මූල්‍ය ව්‍යාපාර ගනුදෙනුවලින් උපචිත වන මූල්‍ය ආරවුල් විය යුතු බවට නිශ්චය කරනු ලැබේ, මේ නියමයේ කාර්ය සඳහා ''ආයතනය'' යන්නෙන්, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ ඒක පුද්ගල සංස්ථාවක් අදහස් වේ ;

(2) එකී ආරවුල් නිරවුල් කිරීම කරගෙන යාම සඳහා, මෙහි උපලේඛනයේ දැක්වෙන ප්‍රදේශ විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශ ලෙස නිශ්චිතව සඳහන් කරනු ලැබේ ; සහ

(3) (2) වන ඡේදය යටතේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශ තුළ සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ උද්ගත වන සමථයට පත් කිරීම මගින් නිරවුල් කළ යුතු වන්නා වූ (1) වන ඡේදය යටතේ නිශ්චය කරනු ලැබ ඇති ආරවුල් වර්ග විෂය වස්තුවෙහි මූල්‍ය වටිනාකම රුපියල් පන් ලක්ෂයකට (රු. 5,00000/-) අඩු විය යුතු බවට නිශ්චිතව දක්වනු ලැබේ.

මොහොමඩ් අලි සබ්රි, ජනාධිපති නීතිඥ,
අධිකරණ අමාත්‍ය.

2021 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**පරිපාලන දිස්ත්‍රික්ක**

1. කොළඹ
2. ගම්පහ
3. මහනුවර
4. මොණරාගල
5. පොළොන්නරුව
6. අනුරාධපුරය

EOG 12 - 0220